# විශ්‍රාන්තිය ගී ද මොපසාංගේ ඇසින්

කේ එච් ඩී ඩී සෙනෙවිරත්න

ගී ද මොපසාං ලියු "බෙල්-අමි" නවකථාව පවන් කොඩිකාර "පෙම්බර මිතුරා" ලෙසින් පරිවර්තනය කළ අතර එතුළින් ප්‍රංශ සමාජය තුළ තිබුණු විශ්‍රාන්තිමය ලක්ෂණ රාශියක් හඳුනා ගත හැකිය.

ඔවුන්ගේ රථ ප්‍රවේශයන්හි ආරුක්කු යට දොරටු පාලයෝ කමිස පිටින් පා විදහා ගෙන පයිප්ප උරමින් වේවැල් පට්ටම් සහිත පුටුවල හිඳ... කෙසේ වුවත් ගණිකාවන් එකතු වන තැන් ඔහුට තවමත් ප්‍රිය විය.ඔවුන්ගේ නැටුම් ශාලා ,ඔවුන්ගේ අවන්හල් සහ ඔවුන්ගේ වීදි ඔහුට ප්‍රිය විය. ඔවුන් සමඟ සමීප ඇසුර,ඔවුන් සමඟ කුලුපග ලෙස සල්ලාපයේ යෙදීම,නාසය දවන ඔවුන්ගේ ලාබ විලවුන්වල සුවඳ ආඝ්‍රාණය කිරීම,ඔහු වටා ඔවුන් සිටින බව හැඟීම ඔහුට ප්‍රිය විය...තමාගේ උගුර දිගේ පහළට ගලන සිසිල් පිනයක ඉමිහිරි වින්දනය ඔහුට සිතින් මවාගත හැකි විය...ඩියුරෝයි තම බීර තොලගාමින් ,මුඛය තුළ පෙරළා යවමින් කිසියම් දුර්ලභ සහ අනර්ඝ දෙයක් මෙන් එය ආශ්වාදනය කරන අතර ෆොරෙස්ටියර් ඔහුගේ බීර සැනින් ගිල්ලේ ය...ඔහු නිහඬව සිටි අතර ගැඹුරු සිතුවිල්ලක නිමග්ගව සිටින බවක් හැඟිය හැකි විය...අවසානයේදී සිළිම යට සහ පොකුරු පහන් වටා එකතු වී ප්‍රේක්ෂකයා පිරී සිටි මුදුන් ගැලරියට ඉහළින් අඳුරු දූම් වලාවක් නිමැ වු, සියලු දෙනාම පාහේ පානය කළ සුරුට්ටු සහ සිගරට්වලින් නික්ම භ්‍රමණය වු දූමෙහි නීල වැස්මෙන් රඟහලේ වඩා දූරස්ථ කොටස්...ඒ දිගු ගැලරියක හැඟීම ජනිත කළ පළමු මහලේ තරප්පු පෙළේ කුඩා චත්වරයේ වු උස බිත්ති කැඩපතක් තුළ ඔහුගෙම පිළිබිඹුව විය.ඔහුට ඇතැම් විට විශ්වාස කිරීමට හැකි වුවාට වඩා කෙතරම් හොඳින් තමන්ව පෙනෙන්නේද යන්න සැබෑ කර ගැනීමෙන් ඔහු ප්‍රීතියෙන් පිනා ගියේ ය...කොර්තොන්වලට මහත් සේ රුචියක් දක්වන්නට වු ඩියුරෝයි හැම වතාවකදීම ඔහුගේ වීදුරුව පිරෙන්නට හැරියේ ය. උදරයෙන් හටගෙන හිස දක්වා නැඟී මුළු සිරුරම ඇවිලගන්නා තෙක් සියලු අවයව පුරා පැතිරී දිවෙන උණුසුම,ශාරීරික ප්‍රහර්ෂයේ ඉමිහිරි ආශ්වාදය ඔහු විඳින්නට පටන් ගත්තේ ය. සම්පුර්ණ සුවදායකත්වයේ හැඟීමක්, ශරීරයේ සහ මනසේත් ජීවිතයේ සහ සිතුවිල්ලේත් සම්පුර්ණ සුවදායකත්වයේ හැඟීමක් ඔහුව ග්‍රහණයට ගත්තේ ය...කාන්තාරෙ හිර වෙලා ඉන්න කාලෙ ලා වියෙ ෆ්‍රොන්සෙ පත්තරේ කියවන්න මට පුළුවන් වුණ එක මොන තරම් ප්‍රීතියක් වුණාද කියල...ඔවුහු සල්ලිපයෙහි යෙදීමට පටන් ගත්හ.ඕපාදූප සම්භාරයක්...ඩියුරෝයි ඇගේ සෑම අභිනයක්ම ඇගේ සෑම ඉරියව්වක්ම, තමාගේ සිතුවිලිවලින් කිසි විටෙකත් වෙනතකට සිත ඇදී යාමකින් තොරව ඇය එම අමුතු ක්‍රීඩාවේ නිරත වන අතර ඇගේ මුහුණේ සහ සිරුරේ සෑම චලනයක්ම නිරීක්ෂණය කෙළේ ය...ඔහු ඇයට ස්තුති කිරීමට වචන සොයා ගත නොහැකිව, ඇය අසළ සිටීම ගැන ප්‍රීතියෙන්, කෘතඥතා පුර්වකව සහ ඔවුන්ගේ ලියලන මිත්‍රත්වය ගැන අනුරාගී ප්‍රීතියෙන් ඇය දෙස බලා සිටියේ ය...එකත් එකට, මමත් ඔබල වගේ. මමත් ලොකු ආශ්වාදයක් ලබනව විද්වතෙක්ගෙ මරණය ගැන පත්කරවල කියවන කොට.මම ඒ වෙලාවෙම මගෙන්ම අහගන්නවා ;"කවුද ඔහුගෙ තැනට පත් වෙන්නේ?" මම මගේ ලැයිස්තුව පෙළ ගස්සනවා.ඒක ක්‍රීඩාවක්,ඒක "අමරණීය කෙනෙක්" අප අතරින් වෙන්ව යන කොට පැරිසියෙ හැම විසිත්ත කාමරයකම ඔවුන් කරන පුංචි විනෝද ක්‍රීඩාවක්. මරණය සහ මහල්ලො හතළියේ ක්‍රීඩාව... විටෙක උත්සුක ලෙස බිල්බොක් ක්‍රීඩාව නරඹමින් ඔවුන් පස් දෙනෙක් හෝ හය දෙනෙක් මේසය මත හිඳ සිටි අතර හාස්‍යජනක චීන පිඟන්මැටි රූ මෙන්... රාත්‍රී භෝජන සාදය ප්‍රීති වාක්‍යයන්ගෙන් සහ වැදගැම්මකට නැති කියමන්වලින් පිරුණක් වු අතර...වාතයට මුසු කොට ගිය වෙර්බෙනා සහ මානෙල් මිශ්‍ර විලවුන් සුගන්ධය කැදර ලෙස ඉව කළේ ය. තමාට හෙට ඩෙමෙරෙල මැතිණියව හමුවන බව මෙනෙහි වීමෙන් ප්‍රමෝදයේ සහ බලාපොරොත්තුවේ හදිසි වෙව්ලුමක් ඔහු හැඟු අතර ඔහුගේ මුළු සිරුර පිනා ගියේ ය.

මෙම කෘතිය මඟින් ප්‍රංශ මධ්‍යම පාන්තික සමාජයේ විශ්‍රාන්තිමය ලක්ෂණ මැනවින් නිරූපණය කරයි.

ගී ද මොපසාං (1885) ,පෙම්බර මිතුරා, සරසවි ප්‍රකාශකයෝ, නුගේගොඩ, පරි-පසන් කොඩිකාර.